එතනින්ම ඒ මනුස්සයා ඉවරයි

රාජ්‍ය නාට්‍ය උළෙලේ හොඳම නළුවා ධර්මප්‍රිය ඩයස්

ක්ලේ කියන කළු ජාතික තරුණයාට කෝච්චි පෙට්ටියකදී අහම්බෙන් සුදු ජාතික කාන්තාවක් හමුවෙනවා. මේ කළු ජාතික තරුණයා සුදු ජාතීන් අනුකරණය කරන සුද්දෙක් වෙන්න හදන තරුණයෙක්. ඇතුලේ තියෙන සැබෑ ස්වරූපය වසා ගෙන වෙනත් ස්වරූපයකින් සමාජයේ ජීවත් වෙන්න උත්සාහ කරන කෙනෙක්.

මෙම සුදු කාන්තාවත් අමුතුම විදිහේ කාන්තාවක්. ඇයගේ නම "හයිනා" ඇය එක එක උපක්‍රම යොදා ගන්නවා මේ කළු තරුණයාගේ ඇත්ත මනුස්සයා එළියට ගන්න. දේශපාලනය, සාහිත්‍යමය දේ විවිධ කරුණු ගැන කතා කරනවා. ඔහු කේන්ති ගස්සලා බලනවා. වරෙක ශරීරය යොදා ගන්නවා මේ සඳහා. කෙසේ හෝ ක්ලේගෙ නියම ස්වරූපය එළියට ඇදල ගන්න ඇයට හැකියාව ලැබෙනවා. අවසානයේ ඇය අතින් ජීවිතක්ෂයට පත්වෙන ක්ලේගෙ සිරුර කෝච්චි පෙට්ටියෙන් බිමට ඇදලා දමනවා.

මෙවර රාජ්‍ය නාට්‍ය උළෙලේ හොඳම නළුවා සම්මානය හිමි වූ හොඳම නිළියට නිර්දේශ වූ චාමික හත්ලාවත්ත ගේ "හයිනා" නාට්‍යයේ කතා සාරාංශයයි මේ. මෙහි ක්ලේ කියන අපූරු චරිතය වෙනුවෙන් වසරේ හොඳම නළුවා සඳහා වූ සම්මානය හිමි වූයේ නාට්‍ය කලාව වෙනුවෙන්ම කාලය කැප කළ කලාකරුවෙකුටයි. රංගනයක් කියන්නේ කුමක්ද? එය ඉදිරිපත් කරන්නේ කෙසේද? යනු නිසි අධ්‍යයනයකින් ඒ පිළිබඳ හැදෑරීමකින් මෙතැනට ආ උත්සාහවන්ත තරුණ නාට්‍ය ශිල්පියෙකි. ඔහු ධර්මප්‍රිය ඩයස්. මේ වන විට සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ අවසන් වසරේ අධ්‍යාපනය ලබනවා.

* ඔබේ කැපවීමට උත්සාහයට ලැබුණු අගනා තිළිණයක් මේ සම්මානය. මොකද ඒ ගැන හිතෙන්නෙ. සන්තෝෂ ද?

දැන් මේ සම්මාන ගන්නවා පත්තරවල පළවෙනවා. රූපවාහිනියෙ පෙන්වනවා. තැනකට ගියහම යම් කිසි අගැයීමක් තියෙනවා. ඒ නිසා පොඩි සතුටකුත් තියෙනවා. නමුත් නාට්‍ය බලලා තියෙන්නෙ බොහොම අතලොස්සයි. ඒ ගැන නම් හරිම කනගාටුයි. මොකක් හරි වැරැද්දක් තියෙනවා මේ නාට්‍යය මිනිසුන් අතරට යන්නෙ නැති. එක්කෝ අධ්‍යක්ෂවරු ඒ ක්‍රමය හොයාගෙන නැහැ. නාට්‍ය හොඳට කරන එක ගැන විතරයි හොයාගෙන තියෙන්නෙ. විශේෂයෙන් අලුත් නාට්‍යකරුවන්.

* මෙයට ප්‍රථම අගැයීමට ලක් වූ අවස්ථා මොනවද?

ලංකා ඉෂාන්ත කංකානම්ගේ ගේ "සඳ සෙවණැල්ල" යෞවන සම්මාන සහාය නළුවා. මගේම කෙටි නාට්‍යයක් කළා "පොපර මාමා සහ පින්තූරය" කියලා රාජ්‍ය නාට්‍ය උළෙලට. පූජිත ද මෙල් ගෙ "අසිත මාලි" ඒවට කුසලතා සම්මාන ලැබිලා තිබෙනවා. ඒ වගේම මේ වතාවත් සමග තුන් වතාවක්ම රාජ්‍ය නාට්‍ය උළෙලේ හොඳම සහාය නළුවාට නිර්දේශ වෙලා තියෙනවා. "අරුන්දතී" (සුමුදු දෙඩන්තැන්න), "වීරයා මැරිලා" (රාජිත දිසානායක), "සූකරයෙක් සමග" (සරත් කොතලාවල) යෞවන සම්මාන නම් ගොඩක් තියෙනවා.

* මේ ලබපු සම්මානයත් සමග ඔබ ඉදිරියේදී යම් කිසි තෝරා බේරා ගැනීමක් කරනවද චරිත තෝරා ගැනීමේදී?

හුඟාක් වෙලාවට මම දැකපු දෙයක් තමයි සම්මානයක් ලැබුණු ගමන් හේතුවක් වෙනවා මනුස්සයෙක් නැති වෙන්න. ඒකට එක එක හේතු එකතු වෙනවා. ඒ නළු නිළියන් හිතන ප්‍රමාණය අනුව. හොඳම නළුවා වුණාට පස්සෙ නාට්‍යයක් කරන්නෙත් නැහැ. නාට්‍යයක් බලන්නෙත් නැහැ. ඒවට වෙලාවකුත් නැහැ. එතනින්ම ඒ මනුස්සයා ඉවරයි. මේක ටිකක් අමතක කරලා මේක තුළින් තව ඉගෙන ගන්න, තවදුරටත් අධ්‍යයනය කරන්න ක්‍රමයක් තමයි මම නම් හිතන්නෙ. මේක ආභරණයක් කර ගන්න තරකයි.

* ඔබ මේ ක්ෂේත්‍රයට යොමුවුණේ කොහොමද?

ඒක නම් ටිකක් දිග කතාවක්. මට අවුරුදු 10 - 12ක් විතර කාලෙ මට මතකයි ලාල් පාගොඩආරච්චි කියන නාට්‍යකරුවගෙ නාට්‍ය බලන්න ලැබුණා. ඒවා තිබුණේ කැස්බෑව වැවමැද්දෙ විවෘතව ඉදිකෙරුණු වේදිකාවක. ඒවයේ හරි අපූරු බවක් තිබුණා. මට මතකයි ඔබත් ඒවායෙ රඟපාපු නළුවෙක්නෙ. ඊට පස්සෙ මම දැක්ක රජාට රඟපෑ මනුස්සයා පාරේ ෆුට් සයිකලයක් පැදගෙන යනවා. එයා ඒකෙත් තමයි වැඩට ගියේ. මට හිතුණා මේ ෆුට් සයිකලේ යන මනුස්සයා නේද එදා රජ වෙලා හිටියෙ. මත් දන්න කියන අයම නේද ඒවායේ රඟපෑවෙ. හරිම සුන්දර පරිසරයක් මවන්න පුළුවන් අපූරු මිනිස්සු කියන එක තේරුණා. ඒ වගේම මගේ වයසෙ පොඩි ළමයි රඟපානවා. ඒව දැක්කම මාවත් ගනියි ද දන්නෙ නෑ කියලා සුන්දර ඊර්ෂ්‍යාවක් වගේ දෙයකුත් දැනුණා. මගේ ආසාව වැඩි වුණා. ඒකෙ ගැට ගහපු ජටා, කරාබු මම ගෙදර ගෙනිහින් කබඩ් එකේ දාලා තියා ගත්තා කවද හරි රඟපාන්න ගන්න පුළුවන් කියා.

ඊට පස්සෙ දහම් පාසලේ (කැස්බෑව ශ්‍රීපති දහම් පාසල) නාට්‍යයක් තිබුණා. ඒකෙ මගෙ හොඳම යාළුවත් (සමන් සුරංග සුරවීර) රඟපානවා. මගේ ආසාව තවත් වැඩි වුණා. යාළුවට මම කිව්වා මාවත් නාට්‍යයට ගන්න කියලා. ඇවිටිලි කරනවා කරනවා හරියන්නෙ නැහැ. "එහෙනම් මට පන්සලෙන් වත්පාස් සෙරෙප්පු දෙකක් හොරකම් කරල දියන්" කියලා යාළුවා කිව්වා. එතකොට වත්පාස් සෙරෙප්පු ආපු අලුත. පස්සෙ මම පන්සලට ගිහිල්ලා වටයක් කැරකිලා බලන කොට තියෙනවා අලුත්ම වත්පාස් දෙකක්. "ඩිත්" ගාලා ද ගත්තා. කෙලින්ම නැවතුනේ යාළුව ළඟ. "මෙන්න සෙරෙප්පු දෙක, මාව දැන් නාට්‍යයට එක්කගෙන පලයන්." "කොහෙන්ද උඹ ඕක ගෙනාවෙ" යාළුව ඇහුවා. "පන්සලෙන්" මම කිව්වා. "තිබ්බ තැනින් දැන්ම ගිහින් තියපන්. මේක ගෑනු සෙරෙප්පු දෙකක්." කියලා යාළුවා කිව්වා. මම ඒකවත් දන්නෙ නැහැ. "හරි උඹ සෙරෙප්පු දෙක ගෙනල්ල දුන්නනේ. මම සර්ට කියලා නාට්‍යයට දාලා දෙන්නම්" කියලා දෙන්නත් එක්කම ගිහින් සෙරෙප්පු දෙක තිබුණු තැනින් තියලා රිහසල් කරන තැනට ගියා.

පිළියන්දල සෙන්ට්‍රල් එකේ සර් කෙනෙක් නාට්‍ය පිළිබඳව උගන්වනවා කියලා සෙනරත් දීපාල් ගමගේ කියන මගෙ යාළුවා ඇවිත් මට කිව්වෙ O/L කරලා පාස් වෙලා ගෙදරට වෙලා ඉන්දැද්දි දීපාල් මගෙ තාත්ත වගේ ගිහිල්ලා සර්ලත් එක්ක කතා කරලා ලෝකෙ නැති බොරුත් කියලා කොහොම හරි සෙන්ට්‍රල් එකට දැම්ම. මම A/L කරන්න හිතේවත් තිබුණේ නැහැ. පන්තිවලට ළමයි අරගෙනත් ඉවරයි එතකොට. භාරකරුට අස්සන් කළෙත් මගෙ යාළුවා.

එතනදී තමයි ප්‍රේමකුමාර කරුණාරත්න සර් හමුවුණේ. ඉගෙන ගන්න එකේ වටිනාකමයි හොඳ නාට්‍ය කරන්නෙ කොහොමද කියන එකයි හොඳ ආරම්භයක් දුන්නෙ ඔහු තමයි. නැත්තම් හොඳ රස්තියාදු කාරයෙක් තමයි ඉතුරු වෙන්නේ.

* මේ වෙන කොට දායක වූ නිර්මාණ ගැන කතා කළොත්.

සෙන්ට්‍රල් එකේ ඉන්න කාලෙදිම "සාලිමා", "මුතු ඇටය" වගේ දිග නාට්‍ය කරලා රාජ්‍ය නාට්‍ය උළෙලේ දෙවැනිවටය දක්වා එන්න පුළුවන් වුණා. බන්දුල විතානගේ ගේ "රෝමය ගිනි ගනී" මගේ පළමු නාට්‍යය ප්‍රසිද්ධ වේදිකාවේ. ඔහුගේම "වැනිසියේ වෙළෙන්දා", කේ. බී. හේරත්ගෙ "දෙවෙනි මහින්ද", "වාසුදේව", ජයලත් මනෝරත්නගේ "කනේරු මල්", "ගුරු තරුව", නීල් අලස්ගේ "සිහින සාප්පුව", රාජිත දිසානායකගෙ "මට වෙඩි තියන් නැද්ද", "වීරයා මැරිලා", මංජුල ජයගුප්තගෙ "දණ්ඩන", සුමුදු දෙඩන්තැන්නගෙ "අරුන්දතී", පූජිත් ද මෙල්ගෙ "අසිත මාලි" වගේ ඒවයෙ රඟපෑව මේ හැම එකක්ම හොඳ නාට්‍ය. මේ අවුරුද්දෙ නාට්‍ය තුනක රඟපෑව. චාමික හත්ලාවත්තගේ "හයිනා", සරත් කොතලාවලගේ "සූකරයෙක් සමග", රුවිනි මනම්පේරිගෙ "නම්බුකාර විලාසිනී" රාජ්‍ය නාට්‍ය උළෙලේදී හොඳ ඇගයීමට ලක්වුණා මේ නාට්‍ය තුනම.

* ටෙලි නාට්‍ය පැත්තට ඔබගේ දායකත්වය අඩු බවකුයි පෙනෙන්නේ. මේ වෙන කොට සම්බන්ධ වුණු ටෙලි නාට්‍ය මොනවාද?

විමලරත්න අධිකාරිගෙ "ඉංගම්මාරුව" අවුරුදු දෙකක් පමණ සම්බන්ධ වෙලා හිටියා. මේ කාලෙදි නම් නාට්‍යවලදී දැකලා මගෙන් වැඩ අරගෙන තියෙන්නෙ නාලන් මෙන්ඩිස්. සංකල්ප ගුණරත්නගේ "පවර මෙනුවර" ප්‍රධාන චරිතයක් කළා. ළඟදීම ඒක විකාශනය වෙනවා.

* ඔබට මේ ක්ෂේත්‍රයේ දී අත හිත දුන් උදවු උපකාර කළ අය කවුරුද?

මගේ අම්ම තාත්තා නැති අඩුව පෙන්නන්නෙ නැතුව බඩගින්නක් දෙන්නෙ නැතුව හැමදේටම සහයෝගය දෙන අක්කලා තුන් දෙනා නිද්‍රා, ඉන්ද්‍රාණී, රූපිකා, අනුර සුසන්ත අයියාත්, අජිත්, දිනේෂ්, රංජි මස්සිනාලා තුන් දෙනා සහ විශේෂයෙන් ප්‍රේමකුමාර කරුණාරත්න සර්. අද මම යම් තැනක ඉන්නවා නම් එහි ගෞරවය හිමිවෙන්න ඕනෙ ඔහුට. සමන් සුරංග සුරවීර, සෙනරත් දීපාල් ගමගේ විශේෂයෙන් කියන්න ඕනෑ. මගේ ජීවිතයේ සන්ධිස්ථාන මේ අය නිසා වෙනස් වුණා. ඒ අතරේ තලින් මාපිටිය හොඳ රුකුලක් දුන්නා විවෘත වේදිකාවට සහ ටෙලි නාට්‍යවලට සම්බන්ධ වෙන්න.

නො. 08, තොරණ පාර, කැස්බෑව. ධර්මප්‍රියගේ ලිපිනයයි.

✍ චන්ද්‍රසිරි ලියනආරච්චි